සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA2 විභාගය - 2018 ජනවාරි

## (AA25) ව්‍යාපාර නීතිය හා ආචාරධර්ම

(Business Law and Ethics)

2018-01-20
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්යය ප්‍රශ්න දහය (10) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.7 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 පහත සඳහන් ඒවා අතුරෙන්, අපරාධ නීතිය (Criminal Law) සම්බන්ධයෙන් නිවැරදි වන්නේ කුමක් ද?

(1) එය පුද්ගලයන් අතර ආරවුලකි.

(2) දිසා අධිකරණයන්හිදී බොහොමයක් නඩු පවරනු ලැබේ.

(3) මහේස්ත්‍රාත් අධිකරණ හෝ මහාධිකරණයන්හි නඩු පවරනු ලැබේ.

(4) එය යම් නිශ්චිත භූමි ප්‍රදේශයක සිටින සුවිශේෂී පුද්ගලයන්ට පමණක් අදාළ වේ.

1.2 ශ්‍රී ලංකාවේ ඉහළම අධිකරණය වන්නේ:

(1) ශ්‍රේෂ්ඨාධිකරණයයි (Supreme Court).

(2) අභියාචනාධිකරණයයි (Court of Appeal).

(3) පළාත්බද මහාධිකරණයයි (Provincial High Court).

(4) දිසා අධිකරණයයි (District Court).

**1.3** පහත සඳහන් ඒවා අතුරෙන්, බැංකුව විසින් චෙක්පතකට ගෙවීම ප්‍රතික්ෂේප කිරීම කළ හැකි අවස්ථාවක් **නොවන්නේ** කුමක් ද?

(1) ණයකරුගේ අත්සන සැකසහිත වීම.

(2) ගිණුමේ ප්‍රමාණවත් ශේෂ පැවතීම.

(3) සංඛ්‍යාවෙන් දක්වා ඇති මුදල සහ අකුරින් දක්වා ඇති මුදල එකිනෙකට වෙනස් වීම.

(4) චෙක්පත පළුදු වී තිබීම.

**1.4** පහත සඳහන් ඒවා අතුරෙන්, බැංකුව සහ ගනුදෙනුකරු අතර ඇති සම්බන්ධතාවය සම්බන්ධයෙන් බැංකුව සතු වගකීමක් **නොවන්නේ** කුමක් ද?

(1) ගනුදෙනුකරුගේ උපදෙස්වලට බැංකුව අවනත විය යුතුය.

(2) ගිණුමේ පවතින ශේෂය දක්වා, නිසිපරිදි අණ කෙරුණු චෙක්පත් ගෙවීම සඳහා බැංකුව බාර ගත යුතුය.

(3) බැංකුවේ වගකීම් ක්‍රියාත්මක කිරීමේදී, සාධාරණ අවධානයකින් යුතුව බැංකුව කටයුතු කළ යුතුය.

(4) ගනුදෙනුකරුගේ ස්ථාවර නියෝග බැංකුව විසින් ක්‍රියාත්මක නොකළ යුතුය.

**1.5** සමාගමක් සංස්ථාපනය කිරීමේ වාසියක් වන්නේ:

(1) වත්කම් ආරක්ෂාවයි.

(2) බදු ඉතිරිකිරීම්.

(3) ප්‍රාග්ධනය ලබා ගැනීම පහසු වීමයි.

(4) ඉහත සඳහන් සියල්ලම.

**1.6** පහත සඳහන් ඒවා අතුරෙන්, ගණකාධිකාරීවරයෙකු මුහුණපාන ආචාරධර්ම ගැටළුවක් **නොවන්නේ** කුමක් ද?

(1) කළමනාකරණයෙන් එල්ලවන පීඩනය.

(2) අනාවරණය කරගත් උල්ලංඝනයන් (violations) වාර්තා කිරීම.

(3) තාක්ෂණික නිපුණත්වය.

(4) ආචාරධර්ම සංවේදීතාවයේ (ethical sensitivity) අඩුබව.

**1.7** පහත සඳහන් ඒවා අතුරෙන්, වෘත්තීය ආචාරධර්මවල ප්‍රධාන මූලධර්මයක් **නොවන්නේ** කුමක් ද?

(1) අරමුණුගත බව. (2) ස්වාධීනත්වය. (3) ආරක්ෂාව. (4) අංවකභාවය.

*අංක 1.8 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.8** ශ්‍රී ලංකාව තුළ අදාලවන විශේෂ නීතීන් (special laws) දෙකක්(02) සඳහන් කරන්න.

**1.9** සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්යයන් (functions) දෙකක්(02) සඳහන් කරන්න.

**1.10** පාරිභෝගික කටයුතු අධිකාරියෙහි (Consumer Affairs Authority) අරමුණක් සඳහන් කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 20)

*A කොටසෙහි අවසානය*

# B කොටස

අනිවාර්යය ප්‍රශ්න පහ (05) කි.

(මුළු ලකුණු 25)

## 02 වන ප්‍රශ්නය

**සිරිපාල** "මැස්ඩා 1200 මොඩලය" ලෙස විස්තර කරමින් මෝටර් රථයක් විකිණීම සඳහා දැන්වීමක් පළ කළේය. **දුමින්ද, සිරිපාලගේ** ස්ථානයේදී මෝටර් රථය පරීක්ෂා කළ අතර, මොටර් රථයේ පිටුපස සවිකර තිබූ "මැස්ඩා 1200 මොඩලය" නමැති පුවරුව දුටුවේය. ඔහු මෝටර් රථය මිලදී ගත් අතර, මෝටර් රථයේ ඉදිරිපස වෙනත් මෝටර් රථ මොඩලයකින් ලබාගෙන, එම කොටස, පිටුපස කොටසට වෑල්ඩින්කොට එකට ඈඳා ඇති බව **දුමින්ද** පසුව දැනගත්තේය. **සිරිපාලට** මොටර් රථය නැවත බාරදී **සිරිපාලගෙන්** ඔහුගේ මුදල් නැවත අයකර ගැනීමට **දුමින්දට** අවශ්‍ය වේ.

මිලදී ගත් මෝටර් රථය වෙනුවෙන්, **සිරිපාලගෙන්** මුදල් නැවත අයකර ගැනීමට **දුමින්දට** හිමිකමක් තිබේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

**පෙරේරා** රු.500,000/- ක රේඛනය කරනලද චෙක්පතක් ණයක් සම්පූර්ණ පියවීමක් වශයෙන් **සුනිල්ට** ලබා දුන්නේය. 2017 අප්‍රේල් 01 දින ලෙස චෙක්පතෙහි දිනය සඳහන් කර තිබුණි. **සුනිල්** බැංකුවට යන අතරතුර අනතුරකට මුහුණදුන් අතර, ඒ හේතුවෙන් ඔහු මාස අටක් රෝහල්ගතවී සිටින ලදී. ඔහු රෝහලෙන් පිටවූ විගස, **පෙරේරා** විසින් දෙනලද චෙක්පත රැගෙන 2017 දෙසැම්බර් 15 දින බැංකුවට ගියේය. **සුනිල්ට** චෙක්පත මුදල් කරගැනීමට අවශ්‍ය විය.

**පෙරේරා** වෙතින් ලද චෙක්පත මුදල් කරගැනීමට **සුනිල්ට** හිමිකමක් තිබේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

**ඇලිස්ට** තම සහෝදරියගේ ජීවිතය සඳහා ජීවිත රක්ෂණ ආවරණයක් ලබාගැනීමට අවශ්‍ය වූ අතර, ඇය රක්ෂණ සමාගම් කිහිපයකට අයදුම්පත්‍ර ඉදිරිපත් කළද, ඉන් එකක්වත් සාර්ථක නොවීය. අවසානයේදී **සීමාසහිත සේෆ් ලයිෆ් රක්ෂණ සමාගම,** ඇය විසින් ඉදිරිපත් කළ අයදුම්පත්‍රය පිළිබඳ විමසනු ලැබීය.

**ඇලිස්ගේ** සහෝදරියගේ ජීවිතය රක්ෂණය කිරීම සඳහා **ඇලිස්** විසින් ඉදිරිපත් කරනු ලැබූ අයදුම්පත්‍රය පිළිගැනීමට **සීමාසහිත සේෆ් ලයිෆ් රක්ෂණ සමාගමට** හැකියාව තිබේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

## 05 වන ප්‍රශ්නය

නෞභාර පත්‍රය (bill of lading), අන්තර්ජාතික වෙළඳාමෙහි ලා ඇති වැදගත්ම ලියවිල්ලයි. මෙහි ඇති මූලිකම ලක්ෂණය වන්නේ, භාණ්ඩ තොගය ප්‍රවාහනය වන අතරතුර පවා, එකී භාණ්ඩ විකිණීමේ හිමිකම අදාල භාණ්ඩවල හිමිකරුට ලැබීමයි.

නෞභාර පත්‍රයක කාර්යයන් **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

## 06 වන ප්‍රශ්නය

ඕනෑම රටක ආර්ථික, සමාජීයය සහ තාක්ෂණික දියුණුවට වැදගත්වන, මිනිස් මොළයේ ක්‍රියාකාරීත්වයෙන් නිර්මාණය වන සියලුම දේ බුද්ධිමය දේපළ (Intellectual property) වේ.

2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනත යටතේ හඳුනා ගනු ලබන බුද්ධිමය දේපළ වර්ග දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

### 07 වන ප්‍රශ්නය

ශ්‍රී ලංකාවේ සංචාරක මහපෙන්වන්නෙකු වන **අශේන්**, විදේශිකයින් කිහිපදෙනෙකු සමඟ යන ඔහුගේ ඊළඟ සංචාරය සැලසුම් කරන ලදී. සංචාරය සඳහා ඔහුට සුවපහසු මෝටර් රථයක් අවශ්‍ය වූ අතර, මෝටර් රථ කුලියට දෙන සමාගමක් වන **සීමාසහිත ඔටෝමොබයිල් ලංකා (පෞද්ගලික) සමාගමෙන්** මෝටර් රථයක් ඇණවුම් කළේය. ඔහුට මගීන් 05 දෙනෙකුට ආසන පහසුකම් සහිත සංචාරය සඳහා සුදුසු සුවපහසු මෝටර් රථයක් විශේෂයෙන් අවශ්‍ය බව ඔහු රථය වෙන්කර ගැනීම (reservation) කරන අවස්ථාවේදී සඳහන් කළේය. කෙසේවුවද, සංචාරය දිනයේදී ඔහුට ලැබුණේ මගීන් දෙදෙනෙකුට පමණක් ප්‍රමාණවත් ස්පෝර්ට්ස් වර්ගයේ (sports car) මෝටර් රථයකි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

මේ සම්බන්ධයෙන් **අශේන්ගේ** නෛතික හිමිකම **විමසන්න.** (ලකුණු 10)

### 08 වන ප්‍රශ්නය

**සුනිමල්,** මරදානේ පිහිටි ආපන ශාලාවක් වන **සීමාසහිත සැම්රෝ (පෞද්ගලික) සමාගමේ**, කෝකියෙකු වශයෙන් සේවය කළේය. ඔහුට උදයේ සහ රාත්‍රියේ නම්‍යශීලී (flexible) සේවාකාලයන් තිබූ අතර, ඔහුට ගෙවීම් කරන ලද්දේ පැය ගණනටයි. ඔහු කුස්සියට අවශ්‍ය වන උපකරණ සඳහා ඔහුට අයත්ව ඇති උපකරණ රැගෙන එන අතර නැවත ඒවා රැගෙන යයි. ඔහු මේ ආකාරයට **සීමාසහිත සැම්රෝ (පෞද්ගලික) සමාගම** සමග පසුගිය වර්ෂ 5 ක සිට සේවයේ යෙදී තිබුණි. ඔහු සේවයට පැමිණි එක් දිනයකදී, ආපනශාලා හිමිකරු පැමිණ නැවත සේවයට නොපැමිණෙන ලෙස ඔහුට දැනුම් දී තිබේ. ඔහුට කිසිදු දැන්වීමක් හෝ වන්දියක් ලබාදී නොමැත. ඔහු නම්‍යශීලී පදනම මත සේවය කරමින් සිටි බැවින් ඔහුට ලිඛිත ගිවිසුමක් ද නොතිබුණේය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සුනිමල්** සේවකයෙක්ද, නැතිනම් නිදහස් ගිවිසුම්කරුවෙක්ද (independent contractor) යන්න **විමසන්න**. (ලකුණු 10)

### 09 වන ප්‍රශ්නය

ආහාර සැපයුම් සේවාවක් සඳහා **කමල්** සහ **බිමල්** හවුල් ව්‍යාපාරයක් ආරම්භ කළ අතර, එහි ව්‍යාපාර කටයුතු පසුගිය වර්ෂයේ ආරම්භ කළේය. ඔවුන් අතරේ හවුල් ව්‍යාපාර ගිවිසුමක් නොතිබූ අතර, හවුල් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේ ගැටළු විසඳා ගැනීමට ඔවුන් 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත අනුගමනය කළේය. ඔවුහු ව්‍යාපාරය පිළිබඳ මූලික තීරණ එක්ව ගත්හ. ඔවුන් පසුගිය වර්ෂය තුළදී උත්සව 20 කට සාර්ථකව ආහාර සැපයුම් සේවා ලබා දුන් අතර, රු. මිලියන 10 ක ශුද්ධ ලාභයක් ඉපැයීය.

**කමල්** හවුල්ව්‍යාපාරයේ ඔහුගේ ලාභ කොටස ලෙස රු.5,000,000/- ක් ලබාගෙන **බිමල්** සමඟ ඇති ඔහුගේ ව්‍යාපාරයේ සබඳතා භාවිත කරමින් ඒ හා **සමාන** (similar) ස්වභාවයේ ව්‍යාපාරයක් තම බිරිඳ සමඟ එක්ව ආරම්භ කළේය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) හවුල්කරුවෙකු වශයෙන් **කමල්** විසින් කඩකළ වගකීම් (duties) පිළිබඳව **විමසන්න**. (ලකුණු 06)

(b) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ ඇතුලත් හවුල්කරුවන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*C කොටසෙහි අවසානය*

## D කොටස

අනිවාර්යය ප්‍රශ්නයකි.

(ලකුණු 25)

### 10 වන ප්‍රශ්නය

(a) **කුමාර්** තම උපාධිය සඳහා ප්‍රථම පංති සාමාර්ථයක් ලබාගත්තේ නම් ඔහුට BMW කාරයක් මිලදීගෙන දෙන බව **කුමාර්ගේ** සීයා පොරොන්දු විය. **කුමාර්** ඉතා මහන්සියෙන් අධ්‍යයන කටයුතුවල යෙදී ප්‍රථම පංති සාමාර්ථයක් ලබා ගත්තේය. **කුමාර්** තම සීයාගෙන් BMW කාරය ගැන විමසූ විට ඔහු සිනාසී ප්‍රකාශ කළේ "එය හුදෙක් ඔබව ධෛර්යමත් කිරීමක් පමණක් බවත් ඔබ ඇත්තෙන්ම සිතනවාද මම ඔබට BMW කාර් එකක් අරන් දෙයි කියා?" යන්නයි. රැවටීමට ලක්වූ බව දැනෙමින් සහ තරහ ගනිමින් **කුමාර්** කියා සිටියේ BMW කාර් එක ලැබීමට ඔහුට නෛතික හිමිකමක් තිබෙන බවයි.

**කුමාර්ගේ** මිත්‍රයෙකු වූ **රවි** හට යම් යම් මූල්‍යමය අපහසුතා පැවතුණි. **රවි** ඔහුට වයස අවුරුදු 13 දී තම ධනවත් නැන්දනිය සමඟ ගිවිසුමකට එළඹුනු අතර, එහිදී ඇය ඔහුගේ පාසැල් ගාස්තු ගෙවන්නේනම්, ඔහු, ඔහුගේ රැකියාවේ ප්‍රථම වර්ෂයේ වැටුප ඇයට ගෙවීමට එකඟ විය. ගිවිසුමට අනුව ඇය ඔහුගේ පාසැල් ගාස්තු ගෙවන ලදී. **රවි** තිසි වයසට එළඹ ඉංජිනේරුවරයෙකු බවට පත්වූ අතර, තම නැන්දනියට වූ පොරොන්දුව සම්පූර්ණයෙන්ම අමතක වී ගොස් තිබුණි. නැන්දනිය ඉල්ලා සිටින්නේ ඔහු ඇයට වසරක වැටුප ගෙවිය යුතු බවත් නැතහොත් නඩු පැවරීමට යටත් විය යුතු බවත්ය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(i) තම සීයාගෙන් BMW කාර් එකක් ලැබීමට **කුමාර්ට** නෛතික හිමිකමක් තිබේදැයි **විමසන්න.** (ලකුණු 07)

(ii) **රවි** තම පළමු වසරේ වැටුප නැන්දනියට ගෙවිය යුතුදැයි **විමසන්න**. (ලකුණු 07)

(b) **සිරි,** වර්ෂයක කාලයක් සඳහා රටින් බැහැරයන බව දන්වමින් **පාල** වෙත ලිපියක් ලිව්වේය. එම කාලය තුළදී සිරිගේ වතුයාය බලා ගනිමින් අදාල අයවියයුතු මුදල් එකතුකර ගනිමින් වතුයාය නඩත්තු කිරීම **පාල** විසින් සිදුකෙරේයැයි අපේක්ෂා කළේය. නිරතුරුවම ඔහුට වතුයායේ ගැටළු සහ තත්ත්වය දන්වමින් ලිපි ලිවිය යුතු බව ද **සිරි** සඳහන් කළේය. පසුව **පාල, සිරි** වෙත ගොස් යතුරු සහ අදාල ලේඛන ලබා ගත්තේය. තවද, **සිරි** කිසිදු දෙයක් ණයට ලබාගැනීම **පාලට** ප්‍රකාශිතව (expressly) තහනම් කළේය. එකී තහනම නොතකා වතුයායේ කටයුතු සඳහා **පාල, පෙරේරාගෙන්** යම් යම් දෑ ණයට ලබා ගත්තේය.

**පාල,** වතුයාය ඉතා හොඳින් බලාගත් අතර, ඔහු වතුයායේ එක් පැත්තක කුඩා ගොවිපොළක් ආරම්භ කරමින් මසකට රු.100,000/- ක් පමණ එමඟින් ඔහු උපයාගෙන තිබේ. කෙසේවුවද, ඔහු ඒ පිළිබඳව කිසිදිනෙක **සිරිට** දන්වා නොමැත. පසුව **සිරි** ඒ පිළිබඳව දැනගෙන පාලගෙන් ඒ බව විමසා තිබේ. එමෙන්ම, ඔහු ණයට බඩු ගැනීමට අවසර දී නොමැති නිසා **පෙරේරාට** ගෙවිය යුතු මුදල නොගෙවිය යුතු බව ද **සිරි** ප්‍රකාශ කළේය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(i) **පාල** විසින් **සිරිගේ** නියෝජිතයා වශයෙන් ඔහු වෙත ඇති වගකීම් කිසිවක් කඩකර තිබේදැයි **විමසන්න**. (ලකුණු 05)

(ii) **පෙරේරා ට** ඔහුගේ මුදල් අයකර ගැනීමට ඇති නෛතික හිමිකම **විමසන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 25)

*D කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන ඇ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |